## ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

## (1995 අංක 30 දරන පනත මගින් පිහිටුවන ලද්දකි.)

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ මූල්‍ය කළමනාකරණ තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යක්ෂ (මූල්‍ය කළමනාකරණ) - අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**

C - 1- 1

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ii) නිර්මාණශීලී බව, නායකත්වය, සැලසුම්කරණය හා කළමනාකරණ පිළිබඳ ඉහළ පෙළ කුසලතාවන්ගෙන් යුත් මනා ශාරීරික යෝග්‍යතාවයකින් හා යහපත් චරිතයකින් යුක්ත අයකු විය යුතුය.

(iii) ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමේ මනා පරිචයකින් යුක්ත විය යුතුය.

(iv) අ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ පූර්ණ සාමාජිකත්වය සමග රාජ්‍ය හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක විධායක ශ්‍රේණියේ තනතුරක වසර 15 ක සේවා කාලයක් සපුරා ඇති අයකු.

හෝ

ආ. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ මූල්‍ය කළමනාකරණ / ග්‍රාමීය මූල්‍ය යන විෂයය ක්ෂේත්‍රවලින් එකක තුන්වන ශ්‍රේණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක වසර 06 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති අයකු.

හෝ

ඇ. ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය / ශ්‍රී ලංකා විගණන යන සේවාවලින් එකක වසර 15 කට නොඅඩු සේවා කාලයක් සපුරා ඇති එම සේවාවේ I පන්තියේ නිලධාරියෙකු හා මූල්‍ය කළමනාකරණ හා ගිණුම් පිළිබඳ දැනුම හා අත්දැකීම් සහිත අයකු විය යුතුය.

**වයස් සීමාව**

අවුරුදු 35 ට නොඅඩු හා 50 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** H.M. - 1-1-2006

මාසිකව රු. 38530/- න් ආරම්භ වී රු. 1100/- ක වැටුප් වර්ධක 15 කින් මාසිකව රු. 55030/- ක් දක්වා වැඩිවන වැටුපක් මේ තනතුරට හිමි වේ.

**ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

තමන් විසින් සකස් කර ගත් අයදුම්පත් 2009-04-20 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු අතර, අදාළ ඉල්ලුම් පත්‍රය සමග උප්පැන්න සහතිකය, අධ්‍යාපන, වෘත්තිය හා අනෙකුත් සුදුසුකම් සනාථ කෙරෙන ලේඛනවල ඡායාපිටපත් ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,**
**04 වන මහල,**
**සෙත්සිරිපාය, බත්තරමුල්ල.**
**2009-03-04**